පෝය දින පණිවුඩය

POYA DAY MESSAGE

දෙව්නුවර, කපුගම සුධර්මාරාමාධිපති, මාතර ශ්‍රී සුදර්ශී මහ පිරිවෙන්හි ආචාර්ය ශාස්ත්‍රපති
**කපුගම සුගතසාර හිමිපාණන් වහන්සේ විසිනි,**

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස...!!!**

## ලෙඩ සුව කර ගැනීමේ මග ආත්ම දමනයයි

කාරුණික පිංවත,

අද මැදින් පුර පසලොස්වක පොහොය දිනයයි. මෙම සදහම් පුෂ්පයේ සුගන්ධය තුලින් අප බලාපොරොත්තු වන්නේ තමාගේ සිත දමනය කර ගැනීම තුලින් කායික මානසික රෝග සුව කරගන්නා ආකාරය පැහැදිලි කර දීමටයි.

අප බුදුරජාණන් වහන්සේගේ අගසව් තනතුරට පත් සැරියුත් මහරහතන් වහන්සේට ඉතා කීකරු නුවණැති ශිෂ්‍ය පුත්‍රයෙක් විය. ඒ කුඩා සාමණේරයන් වහන්සේගේ නැණ ගුණ ගැන සලකා පණ්ඩිත සාමණේර නමින් හඳුන්වනු ලැබූහ. දිනක් තම ඇදුරු සැරියුත් හිමියන් සමග පිඬු පිණිස වඩින සාමණේරයන් වහන්සේ ගොවියන් ඇළ මාර්ගයෙන් ජලය ඒ ඒ තැන් වලට ගෙන ගොස් ඉන් ප්‍රයෝජන ගන්නා සැටි දුටුවේය. යකඩ වැඩ කරන හී වඩුවන් යකඩ නමා නොයෙක් කර්මාන්ත කරන සැටිත්, වඩු කාර්මිකයින් ලී දඬු නවා නොයෙක් විසිතුරු කර්මාන්ත කරන සැටිත් දුටුවේය. මේ ජලය යකඩ ලී දඬු යනාදී භෞතික වස්තූන්ට සිතක් නැත. නමුත් සිත් ඇති ඒවා සකස් කොට ඉන් ප්‍රයෝජන ලබති. මටත් මාගේ සිත සකස් කර ගත හැකි නොවේදැයි සිතා ආරාමයට අවුත් භිවනා කර රහත් ඵලයට පත් වූහ.

මේ ගැන දැනගත් බුදුරජාණන්වහන්සේ මේ කාරණය නිමිති කරගෙන

උදකංහි නයන්ති නෙත්තිකා
උසුකාරා නමයන්ති තේජනං
දාරුං නමයන්ති තච්ඡකා
අත්තානං දමයන්ති පණ්ඩිතා යනුවෙන් දේශනා කොට පණ්ඩිත සාමණේර වහන්සේගේ අදහස ස්ථාපිත කල සේක. ධම්මපදයේ පණ්ඩිත වග්ගයේ සඳහන් මෙම ගාථාවෙන් උගන්වන්නේ ගොවියෝ තමන් කැමති තැන්වලට ජලය ගෙන යන්නාසේ හී වඩුවන් තමන් කැමති පරිදි හී දඬු නවා සකස්කරන්නා සේ වඩුවන් තමන් කැමති පරිදි ලී දඬු නවා සකස් කරගන්නා සේ නුවණැති අය තම සිත දමනය කරගෙන තම අභිවෘද්ධිය සකස් කර ගන්නා බවයි.

මෙම ගාථා ධර්මයෙන් සමාජයට දෙන පාඩම වන්නේ යමක් ප්‍රකෘතියෙන් තිබෙනවාට වඩා සකස් වීම තුළ වැඩි වටිනාකමක් ඇතිවන බවයි. ජලය එක තැන පල්වෙමින් තිබුණට ප්‍රයෝජනයක් නැත. ඇළ මාර්ගයෙන් එම ජලය තමන් නිසි තැනට ගෙන ගොස් ගොවි බිම සරු කලහොත් ජලයේ වටිනාකම පෙනේ. යකඩ එම ස්වභාවයෙන්ම නොතබා ඒවා රත්කොට නවා විවිධ භාණ්ඩ නිෂ්පාදනය කලහොත් එහි අගය වැඩිවෙයි. දැව ඒ ස්වභාවයෙන්ම නොතබා ඒවා සකස් කොට නොයෙක් භාණ්ඩ නිෂ්පාදනය කලහොත් වටිනාකම වැඩිවෙයි. යකඩ සහ දැව උපයෝගී කරගෙන සකස් කරන ඇඳ, පුටු කබඩ් ආදියේ වටිනාකම වැඩිවී තිබෙන්නේ ඒවා සකස් වී ඇති නිසාය. අපේ සිතද එසේමය. පුරුදු පුහුණු නොකරණ ලද අභාවිත සිත වටින්නේ නැත. වටින්නේ පුරුදු පුහුණු කරන ලද භාවිත සිතයි. මෙහි භාවිත සිත යනු ලෝතතු මැනවින් වැටහෙන සිතටයි. ගෞතම බුදුන් වහන්සේ ඉතා දිගු කලක් සසරේදී තම සිත පුරුදු පුහුණු කල සේක. එහිදී සිදුවූයේ තමනුත් දමනය වී අන් අයත් දමනය කිරීමයි. "අත්තානං දමයන්ති පණ්ඩිතා" යනුවෙන් දේශනා කලේ එයයි.

පාලි භාෂාවේ අත්ත ශබ්දය ක්‍රම දෙකකට විස්තර වෙයි. "නිත්‍ය වූ ආත්මය" යනු එක් අර්ථයකි. "තමා" යනු අනෙක් අර්ථයයි. වේද යුගයේ පටන් උපනිශද් යුගය දක්වා පුද්ගලයා තුල නිත්‍යවූ ආත්මයක් ඇතැයි පිළිගත්හ. ඒ

නිත්‍ය වූ ආත්මය ඔහුට ඇති පරම සැපත ලෙසද සැලකූහ. මේ ආත්මවාදී චින්තය වනාහි සියළු කායික, මානසික රෝග වල මූල බීජයයි. බුදු දහම ඉදිරිපත් කල අනාත්ම ඉගැන්වීම තුලින් සියළු කායික හා මානසික රෝග සුවපත් වන්නේය.

පස්වග තවුසන් සිදුහත් තාපස තුමා අත්හැර ගියේ ආත්මවාදී රෝගයෙන් පෙලී සිටි බැවිනි. ඒ නිසා පළමු දම් දෙසුමෙන් ඒ රෝගය සුවපත් කල සේක."යංකිඤ්චි සමුදය ධම්මං සබ්බංතං නිරෝධ ධම්මං" යනුවෙනි. ඇතිවූ සියල්ල නැතිවේය යන ප්‍රකාශය මුළු මහත් භාරතීය චින්තනයම වෙනත් මගකට යොමු කල යුග ප්‍රවර්තක ප්‍රකාශයකි.ඒ ප්‍රකාශය එසේ නොවේයයි කිසිවෙකුටවත් ප්‍රකාශ කල නොහැකි යැයි අභීත සිංහ නාදයක්ද කලේ එබැවිනි. නමුත් භෞතිකවාදී චින්තකයින් පරමාණුව සොයාගෙන ඒ මතය වෙනස් කරන්නට පෙළඹුනේ ඔවුන් ඒ තරමටම ආත්මවාදී රෝගයෙන් පෙළි සිටි බැවිනි. තව දුරටත් පරීක්ෂණ කල භෞතික විද්‍යාඥයින්ගේ ඊලඟ මතය වූයේ පරමාණුවද විනාශ වන බවයි. බුදුන් වහන්සේ දේශනා කළ විශ්ව සාධාරණ අනිත්‍යතාවය ලෝකයා හඳුනා ගත්තේ එදිනය.

දෙවන දෙසුම වන"අනත්ත ලක්ඛණ"සූත්‍රයේදී රූප - වේදනා ආදී ස්කන්ධ 5 අනිත්‍ය දුක්ඛ - අනාත්ම යන තිලකුණට නගා දේශනා කිරීමෙන්ද සිදු කළේ පස්වග තවුසන්ගේ සියලු රෝග සුවපත් කිරීමයි. බුදුන්වහන්සේට ලෝකවිදූ යැයි කියන්නේ ලෝතතු මැනවින් අවබෝධ කරගත් නිසායි. ලෝකය චංචල බවත් එහිදී කිසිවෙකුටවත් නිශ්චල නිගමනයකට බැසිය නොහැකි බව බුද්ධ දේශනාවයි. එබඳු ස්ථිර තීරණයකට යමෙක් එළඹෙන්නේ නම් ඔහුගේ විචාර බුද්ධියට ඉඩක් නොලැබේ. එවිට ඔහු මෝඩයෙකු ලෙස මානසික ව්‍යාධියකින් පෙලෙන්නේය. පසුගියදා සුනාමියෙන් සිදුවූයේ කුමක්ද ? ලෝකය චංචල බව ප්‍රකට කිරීමකි. නමුත් එදා අපි සියල්ලෝම රෝගීන් වූයේය. ඊට හේතුව එම ලෝකය නිශ්චල එකක් යයි සිතා සිටි බැවිනි.

මෙම ත්‍රිලක්ෂණය නම්වූ විදර්ශනා ප්‍රඥාව යමෙකුට ඇත්නම් ඔහු පණ්ඩිතයෙකි. මේ දේශනාවෙන් පැහැදිලි කරන්නේ ත්‍රිලක්ෂණයෙන් සකස්වූ සිත වටිනා බවයි. ජලය,යකඩ,දැව ආදිය සකස්වූ තරමට වටින්නාසේ සිතද සකස්වූ තරමට වටී. මෙසේ සිත සකස් කර ගැනීමට අපොහොසත් අය තම ජීවිතය නිසරු කර ගනී.

පසුගිය දිනෙක බස් රථයක ගමන් කරන විට ගීතයක් ඇසුනි. එහි පද දෙකක් මෙහි සඳහන් කරමි.

කොච්චරද ආදරේ කියලා අහන්න එපා
මෙච්චරද ආදරේ කියලා අහන්න එපා

අප මේ පලමු ප්‍රශ්නය යමෙකුගෙන් අසන්නේ ඔහු සියයට සියයක්ම අපට ආදරේ ඇතැයි යන ආත්මවාදී චින්තනයේ පිහිටා සිට ගෙනයි. නමුත් එය වෙනස් උවහොත් අපේ සිත දූෂ්‍ය වෙයි. එම මානසික රෝගය අපට ඇතිවූයේ කෙසේද ? ආත්මවාදී චින්තනය නිසායි.කොසොල් රජතුමා මල්ලිකා දේවියගෙන් මේ ප්‍රශ්නය ඇසුවිට ඇය කීවේ මම ආදරේ මට කියායි. රජු බලාපොරොත්තු වූයේ එවැනි පිළිතුරක් නොවේ. රජතුමා මෙහිදී මානසික රෝගයකින් වෙලී බුදුන් වහන්සේ හමුවට ගියහැටි සංයුත්ත නිකායේ මල්ලිකා සූත්‍රයෙහි සඳහන් වේ. බුදුන් වහනසේ එහිදී රජතුමාගේ සිතේ තිබූ මානසික ව්‍යාධිය නැමති යකඩ ගුලිය තලා එම රෝගය සුවපත් කල සේක. නූතන සමාජය තුලත් මෙවැනි රෝගීන් සිටිනා බව අපි දනිමු. ඊට හේතුව සදහටම ඔබ මගේ වැනි ප්‍රකාශ වලින් අප රැවටී සිටිනා බැවිනි. එම ප්‍රකාශය බුදු දහමට නොගැලපෙන ආත්මවාදී ප්‍රකාශයකි. එමගින් සිදු වන්නේ අප මානසික රෝගීන් වීමයි. එය තව දුරටත් උත්සන්න වූ කල කායික රෝගී තත්වයක්ද ඇති කරයි.

භික්ෂූන් වහන්සේලා තම විහාරස්ථානය දියුණු කර ගැනීමට ශිෂ්‍ය පුත්‍රයන් තනති. එම ගුරුවරු විශාල ධනයක් හා ශ්‍රමයක් වැය කොට එම ශිෂ්‍යයින් සකස් කරන්නේ අනාගතයේ ස්ථිරවූ හැඟීම් ඇති කරගෙනය. තම ශිෂ්‍යයයා හොඳට ඉගෙන ගෙන විහාරස්ථානය රැකගෙන තමනුත් ආරක්ෂා කරගනී යනුවෙනි. එය සෙලවෙන ලෝකය තුල නොසෙල්වෙන තීරණයකි. යම් දිනෙක එම ශිෂ්‍යයයා උපැවිදි වී තමනගෙන් ඈත්වූ විට ගුරුවරයා මානසික රෝගියෙක් වේ. සමහර සිසුන්ද තම ගුරුවරයා ගැන එසේ සිතයි. චංචල ලෝකය තුල ගුරුවරයාටත් එසේ වෙනස් වන්නට සිදුවුනහොත් ශිෂ්‍යයෝ මානසික රෝගීන් වෙති. ඒ නිසා දෙපක්ෂයම මේ බව තේරුම් ගෙන ත්‍රිලක්ෂණයට අනුව සිත සකස් කර ගත හොත් ඔවුන් පණ්ඩිතයෝය.

දෙමාපියන් තම දරුවන් වෙනුවෙන් කරන කායික, මානසික කැපවීම අප්‍රමාණය. ඒ කැපවීම අනුව තම දරුවන හැමදාම අපට කීකරු විය යුතුයි. අපිට ඇප උපස්ථාන කල යුතු යැයි ස්ථිර නිගමන වලට බැස ක්‍රියාකරයි. නමුත් සෙලවෙන ලෝකය තුල ඒ දරුවන්ද එසේ සෙලවී දෙමාපියන්ට අකීකරු වුවහොත් නොසලකා හැරියහොත් දෙමාපියන්ට එය දරන්නට නොහැකිය. එවිට ඔවුන් මානසික රෝගීන් වන අතර එය කායික රෝගී තත්වයක්ද ඇති කරවයි. ඒ නිසා ත්‍රිලක්ෂණයට අනුව ක්‍රියා කරමින් එවැනි ස්ථිර තීරණ වලින් අපි නිදහස් වෙමු. දරුවන්ද දෙමාපියන් ගැන එවැනි ස්ථිර තීරණ ගෙන ක්‍රියා කරයි නම් යම් දිනෙක ඒවා වෙනස් වුවහොත් මානසික රෝග වලට පත් වෙති. ඒ නිසා මාපිය- දූ දරු දෙපක්ෂයම මේ ගැන සිතා ක්‍රියා කරමින් මානසික සහනය ඇති කර ගත යුතුය.

පැරණි යුගයේ අප අසා ඇත්තේ අට අනුවක් රෝග සහ නව අනූවක් ව්‍යාධි තිබූ බවයි. නමුත් දැන් ඒ මිනුම් 1000න් වැඩි කරන්නට සිදුවී තිබේ. ඊට හේතුව ඒ තරමටම මානසික හා කායික රෝග බහුල වීමයි. ලංකාව අද ලෝකයේ සිය දිවි නසාගන්නවුන් අතර පළමු ස්ථානය ලබා තිබේ. මීට හේතුව කුමක්ද? ඉහත කී ආත්ම වාදී චින්තනයයි. එසේ නම් ලංකාවේ වැඩිපුර සිටින්නේ ආත්මය දමනය කර නොගත් මෝඩයින්ය යන්න ලෝකයාම තේරුම් ගෙන හමාරය. එසේ නම් ලෝකය තුල අප නොවටින තඹයට වැටුනේ අපේ සිත් සකස් නොවූ බැවිනි. අපි මේ ත්‍රිලක්ෂණයට අනුව සිත සකස් කර ගත හොත් එම ලෝක වාර්තාව වෙනස් කල හැකි වෙයි.

අප ගුරු දෙව් මහාචාර්ය ඩබ්. එස්. කරුණාරත්න මහතා නිතර අපට කී උපදේශයක් වූයේ " චංචල ලෝකය තුල නිශ්චල නිගමන වලට එළඹීම වනාහි විචාර බුද්ධියෙන් සමු ගැනීමක් බවයි". ත්‍රිලක්ෂනය අවබෝධ නොවන කිසිවෙකුට පණ්ඩිතයෙකු විය නොහැකිය. එම නිසා විදර්ශනා ප්‍රඥාව ඇති කර ගෙන සකස් කරගත් සිතක් ඇති අයෙක් වී සියළු කායික මානසික  රෝග සුවපත් කර ගනිමු.



බුදු සරණයි...

www.lakruhuna.com

Designed By MIRACLE CREATIVE GALLERY 0544 901 366